ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021/10/25

පැමිණිලි පාර්ශවය : එස්.පී.සෝමාවතී මිය,
අංක : 133, මොටන ජනපදය,
බලන.

වගඋත්තර පාර්ශවය : 1. අධ්‍යක්ෂ (ගොවි විශ්‍රාම වැටුප්),
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,
අංක : 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,
නුගේගොඩ.

2. අධ්‍යක්ෂ ජනරාල්/ අමාත්‍යංශ ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යංශය,
අංක : 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

**පැමිණිලි අංකය : HRC/1642/18**

**පැමිණිල්ල :-**

උක්ත පැමිණිලිකාරිය සිය පැමිණිල්ල කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් දන්වා ඇත්තේ, තම ස්වාමි පුරුෂයාට ගොවි විශ්‍රාම වැටුප් හිමිකම පැවති බවත්, 2018.01.14 දින ස්වාමි පුරුෂයා මියගිය බවත්, ඔහුගේ මියයාමෙන් පසු ඔහුට හිමි වූ ගොවි විශ්‍රාම වැටුප් හිමිකම තමාට හිමිවිය යුතු වන නමුත්, මියගිය දිනයේ සිට මේ දක්වාම තමාට එකී හිමිකම ලබාදී නොමැති බවත්, ඒ හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර, පරීක්ෂණය ආරම්භයේදීම පැමිණිලිකරු, වගඋත්තරකාර පාර්ශවයක් ලෙස ප්‍රාදේශිය ලේකම්, පිළිමතලාව නම් කල ද, මෙම පැමිණිල්ලේ කාරණා සම්බන්ධයෙන් තමාට කිසිදු වගකීමක්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නොපැවරෙන බවට සඳහන් කර ඇත. ඒ සම්බන්ධයෙන් 01 හා 02 වගඋත්තරකරුවන් විරෝධතාවයක් දක්වා නොමැත. ඒ අනුව මෙම විමර්ශනයෙන් ප්‍රාදේශීය ලේකම්, පිළිමතලාව නිදහස් කිරීමට කොමිෂන් සභාව තීරණය කොට ඇත.

අනෙකුත් වගඋත්තර පාර්ශවයන් විසින් සිය ලිඛිත හා වාචික කරුණු දැක්වීම මගින් කොමිෂන් සභාව හමුවේ දන්වා ඇත්තේ, පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි දායකයෙකු වී ඇති අතර, 2001 වර්ෂයේ සිට ඔහු ගොවි විශ්‍රාම වැටුප් හිමිකම ලබා ඇති බවයි. කෙසේ වෙතත් 2011 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි මුදල් අවසන් වීම හේතුවෙන් ගොවි විශ්‍රාම වැටුප් හිමිකම් ලාභීන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමට නොහැකි වූ බවත්ය. නැවත 2014 වර්ෂයේදී අංක 1853/49 හා 2014.03.14 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත යටතේ නියෝග නිකුත් කොට ඇති බවත්, එකී නියෝගයන්ට අනුව නැවත විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමට තීරණය කර ඇති බවත් දක්වා ඇත. නමුත් මෙම ගැසට් නිවේදනයට අනුව එතෙක් ගොවි විශ්‍රාම වැටුප් දායකයාගේ මියයාමෙන් පසුව ඇයගේ හෝ ඔහුගේ කලත්‍රයාට හිමිකම් පැවැති විශ්‍රාම වැටුප් හිමිකම අහිමි කොට ඇති බවත්, ඒ සම්බන්ධයෙන් නෛතික ප්‍රතිපාදන දක්වා නොමැති බවත්, ඒ හේතුවෙන් පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා 2018 වසරේදී මියයාමෙන් පසුව ඔහු ලබමින් සිටි විශ්‍රාම වැටුපට ඔහුගේ කලත්‍රයාට හිමිකම් පෑමේ අයිතිවාසිකම් නොපවතින බවත් කරුණු දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :**

පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට 1996.01.29 වන දින දායක වී ඇති අයෙකු වන අතර, ඔහු විසින් රු. 690/- බැගින් වාරික 10 ක් අර්ධ වාර්ෂිකව ගෙවීම් කර 2001.07.01 දින සිට විශ්‍රාම වැටුප් හිමිකම ලබා ඇත. ඒ අනුව ඔහු ගොවි විශ්‍රාම වැටුප් මණ්ඩලයට කර ඇති මුළු ගෙවීම රු. 6900/- ක් බව අනාවරණය වේ.

1987 වර්ෂයේ ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් රු. 200/-බැගින් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කොට ඇති අතර, එකී මුදල රු. 1000/- ක්දක්වා 2011 වර්ෂය වනවිට වැඩිකර ඇති නමුත්, ගොවි විශ්‍රාම වැටුපෙහි දායක මුදල කිසිදු අවස්ථාවක ඉහළ නැංවීමක් සිදුකොට නොමැති බව වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවට ලිඛිතව දන්වා ඇත. ඒ අනුව 2011 වර්ෂය වනවිට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය තත්වයට පත්වී විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවා ඇති බව ද අනාවරණය වේ. ඒ අනුව, 2012 සහ 2013 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු කොට නොමැත.

කෙසේ වෙතත් 2014.03.14 දිනැති 1853 අංක 49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, එහිදී පැරණි දායකයින් නව යෝජනා ක්‍රමයට

අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කර ඇති නමුත්, මියගොස් ඇති දායකයින්ගේ කලත්‍රයන් නව යෝජනා ක්‍රමයට හඳුන්වා දී නොමැති බව අනාවරණය වේ.

ඉහත තත්වය සලකා බැලීමේදී, අංක 1853/49 හා 2014.03.14 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කිරීමේදී රජය විසින් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට ඍජුවම දායකත්වය ලබා දී ඇති දායකයින්ගේ හිමිකම පිළිබඳව පමණක් අවධානය යොමු කොට ඇති බවත්, එකී දායකයින්ගේ කලත්‍රයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවධානය යොමු කොට නොමැති බවත් නිරීක්ෂණය වේ.

ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලෙස සැකසී ඇති නමුත්, කිසියම් විශ්‍රාම වැටුපක් යම් පුද්ගලයෙකුට ගෙවීමට රජයක් ක්‍රියා කරනු ලැබීමේ මුඛ්‍ය අරමුණ කෙරෙහි අවධානය යොමු කිරීමේදී විශ්‍රාම වැටුප් හිමිකම් පාන දායකයාගේ මෙන්ම ඔහුගෙන් යැපෙන්නා වූ ඔහුගේ කලත්‍රයින්ගේ ද දෛනික ජීවිතය විශ්‍රාම වැටුප් හිමිකම් ලාභියා විශ්‍රාම යාමෙන් පසු ආරක්ෂා කිරීම වන බව නිගමනය කළ හැක. ගොවි විශ්‍රාම වැටුප් හිමිකම හෝ වෙනත් කිසියම් විශ්‍රාම වැටුප් හිමිකමක් ඇති කිරීමේදී එකී හිමිකම ලබාගැනීමට පූර්ණය කළ යුතු අවම නෛතික ප්‍රතිපාදන හෝ අවශ්‍යතා සම්පූර්ණ කොට ඇති අවස්ථාවකදී නැවත විශ්‍රාම වැටුප් හිමිකරුවෙකු විසින් එකී විශ්‍රාම වැටුපට කුමන ප්‍රමාණයකින් මූල්‍යමය ලෙස දායක වී ඇත්ද යන්න පසුකාලීනව නැවත ගණනය කරමින් විශ්‍රාමිකයාගේ අයිතිවාසිකම් විශ්ලේෂනය කිරීම නීත්‍යානුකූලව හෝ සදාචාරාත්මකව අර්ථ ගැන්විය හැකි කාරණයක් ලෙස නිරීක්ෂණය නොවේ.

කෙසේ වෙතත්, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට සලකා බැලීමේදී, වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීමට අනුව 2011 වසර වනවිට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය තත්වයට පත්වී තිබීම මත එකී විශ්‍රාම වැටුප් ක්‍රමය කෙරෙහි නව නීති තත්වයක් අනුමත කොට ගැනීමේ හා හඳුන්වා දීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත. ඒ අනුව 2014 වසරේදී ගොවි විශ්‍රාම වැටුප නැවත ආරම්භ කොට දායකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 1853/49 හා 2014.03.14 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කොට ඇති අතර, මෙම නව ගැසට් පත්‍රය නිකුත් කිරීමේදී ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි දායකයාට පමණක් හිමිකම් ලබා දී ඇති අතර, ඔහුගේ කලත්‍රයාට එකී හිමිකම අහිමි කිරීමට ක්‍රියා කොට ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ දීර්ඝ කාලීනව නියැලී සිටින ප්‍රජාවගේ ජීවිතයේ සැඳෑ සමය ආරක්ෂා කිරීමේ අරමුණ වෙනුවෙන් සහ ඔවුන්ගෙන් යැපෙන්නා වූ ඔවුන්ගේ කලත්‍රයින්ගේ දෛනික ජීවිත පවත්වාගෙන යෑම පහසු කිරීම සඳහා ගෙන ඇති පියවරක් වන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය තුළ කලත්‍රයාගේ හිමිකම් අහිමි කිරීම මඟින් කිසියම් සාධාරණ නොවූ ක්‍රියාවක් සිදුවී ඇති බවත්, ඒ තුළින් සමාජයේ පහසුකම් ලැබිය යුතු කොටසක් සාධාරණ නොවන ආකාරයෙන් අසරණ කොට ඇති බවත්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය අංශය වගකීමකට යටත්විය යුතු බවටත් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වේ.

එමනිසා 2014 වසරේදී අංක 1853/49 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ඇති කොට ඇති නව නීති තත්වය සංශෝධනය විය යුතු බවටත්, ඒ අනුව ගොවි විශ්‍රාම වැටුප් දායකයාට මෙන්ම ඔහුගෙන් යැපෙන්නා වූ කලත්‍රයාට ද එකී හිමිකම එක සේ පැවතිය යුතු බවටත් මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ.

ඒ අනුව මෙම ගැටළුව සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට සියළු වගඋත්තර පාර්ශවයන් වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
B/Human Rights Commissioner of Sri Lanka

මා.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka